www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුසියාවට එරෙහි සම්බාධක මත ජී7 එක්සත්කම ඉරි තලයි

## G7 unity shows cracks on Russia sanctions

**බිල් වැන් ඕකන් විසිනි**
**2014 ජුනි 06**

දශක දෙකක් තුල පලමු වතාවට රුසියාවේ සහභාගිත්වයෙන් තොරව පැවැත්වුනු ජී8 කන්ඩායමේ -දැන් ජී7 කන්ඩායම- රැස්වීම, කියෙව්හි දක්ෂිනාංශික පාලන තන්ත්‍රයට පිටුබලය දීම හා ක්‍රිමියාව ඈඳා ගැනීම සම්බන්ධයෙන් හා නැගෙනහිර යුක්‍රේනය "අස්ථාවර කරන" බවට චෝදනා නගමින් මොස්කෝව හෙලාදැකීමට බ්‍රසල්ස්හිදී නිකුත් කල ඒකාබද්ධ ප්‍රකාශනයකින් එකඟ වූහ.

ගෝලීය ආර්ථිකය, දේශගුනික විපර්යාස හා බලශක්තිය වැනි ප්‍රශ්න පිලිබඳ බාගෙට තැම්බුනු යෝජනා තුලින් සමුලුව ඉදිරියට යන අතර එක්සත් ජනපදය (එජ), බ්‍රිතාන්‍ය, ප්‍රන්සය, ජපානය, ඉතාලිය හා කැනඩාව යන රටවල නායකයින් හමුවේ තිබුනු හරයක් ඇති එකම ප්‍රශ්නය වූයේ යුක්‍රේන අර්බුදයයි.

මෙවැනි අවස්ථාවන්ට සාමාන්‍යයෙන් සහභාගී වන අමුත්තන් හා නිරීක්ෂකයින් කිසිවෙකුත් ඇතුලත් නොවුනු, කප්පාදු කරන ලද සමුලුව, කෙසේ වෙතත්, ඔබාමා පාලනාධිකාරය විසින් ගෙනෙන ලද නව වටයක සම්බාධක පැනවීම සඳහා කිසිදු සංයුක්ත සැලැස්මක් අනුමත කරගැනීමට අසමත් විය. යෝජිත පියවර, සාපේක්ෂ වශයෙන් එජ මත ඇතිකල හැකි සුලු බලපෑම සමග සසඳන කල පෙනී යන පරිදි, බටහිර යුරෝපීය ආර්ථිකයන් කෙරෙහි දරුනු ආර්ථික බලපෑම් ඇතිකිරීමේ හැකියාව මුල්කරගෙන සමුලු එක්සත්කම තුල ඉරිතැලීම් හටගෙන තිබුනි.

යුක්‍රේනයේ නීත්‍යානුකූලව බලයට පත් ජනාධිපති වික්ටර් යනුකොවිච් පෙරලා දැමූ පෙබරවාරි කුමන්ත්‍රනයට පෙරමුන ගත් ෆැසිස්ට්වාදීන්ගේ ප්‍රචන්ඩත්වයට ආවඩමින් හා උඩගෙඩි දෙමින්, ජර්මනිය හා අනෙකුත් යුරෝපීය බලවතුන් හා ජර්මනිය සමග එක්ව වැඩකල තැන් පටන් වොෂින්ටනය, රුසියාව සමග ආතතීන් උග්‍ර කිරීම සඳහා හැකි සෑම ආකාරයකින්ම මැදිහත් විය. ඔවුන් ආර්ථික සම්බාධක පැනවූවා පමනක් නොව, පෝලන්තය තුල එජ ප්‍රහාරක ගුවන් යානා ස්ථානගත කර, ඇමරිකානු පැරාටෲපර් හමුදා පෝලන්තයට මෙන්ම පැරනි සෝවියට් සමූහාන්ඩු තුන වෙත පිටත්කර හැරියේය. අවසාන වශයෙන් එජ මිලිටරි සේනාංක රුසියානු දේශසීමාව දක්වාම ගෙන එමින් කලු මුහුදට යුද නෞකා ඇතුලු කලේය.

එන්ට එන්ටම පැහැදිලි වන කාරනය නම්, මිලිටරිමය වශයෙන් රුසියාව වැටලීමත්, යුරේසියාවේ හා මැද පෙරදිග එජ අධිකාරයට බාධාවක්ව ඇති රුසියාව අතුගා දැමීම පිනිස පසුබිම සකස් කිරීමත්, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපාය වී ඇති බවය.

නරුමත්වය හා කුහකත්වය අතින් ජී7 විසින් කෙටුම්පත් කල විදෙස් පිලිවෙත් ප්‍රකාශනය සැලකිය යුතු තරම්ය. එය මැයි 25දා යුක්‍රේන මැතිවරනය "සාර්ථක ලෙස පැවැත්වීම" හුවා දැක්වීය. ජනාධිපති ලෙස පත්වූයේ ප්‍රකෝටිපති "චොකලට් රජු" ලෙස විරුදාවලී ලත් පෙට්රෝ පොරොෂෙන්කෝය. මෙහිදී මිලිටරි වටලෑමකට මුහුනපා සිටින නැගෙනහිර යුක්‍රේනයේ මිලියන ගනනක් ඡන්දය පාවිච්චි නොකිරීමේ කාරනය නොසලකා හරියි. යුක්‍රේන මැතිවරනය හුවා දැක්වූ විගසම ප්‍රකාශනය, එවැනිම කොන්දේසි යටතේ සතියකට පසුව පැවැත්වූ සිරියානු මැතිවරනය "වංචාවක්" යයි හෙලාදුටුවේය.

ප්‍රකාශනය මගින්, නැගෙනහිර පලාතේ "නීතිය හා සාමය ඇතිකිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත මානයක් පවත්වාගෙන යාමට" කියෙව් තන්ත්‍රය "දිරිමත්" කල අතර "පුලුල් ආකාරයේ ජාතික සංවාදයක්" පවත්වාගෙන යාමට එය දක්වන කැමැත්ත පිලිබඳව ප්‍රසාදය පල කරයි.

"නිශ්චිත මානයක් හා පුලුල් සංවාදයක්" පිලිබඳව බ්‍රසල්ස්හි දී ජී7 රාජ්‍ය නායකයින් කතාබහ කරද්දී, නැගෙනහිර යුක්‍රේන භූමිය තුල, බහුවිධ යුද අපරාධ ලෙස අංගලක්ෂනය කල හැකි සිවිල් වැසියන්ට දරුනු ලෙස ප්‍රහාර එල්ල කරන බවට සාක්ෂි ලැබෙමින් තිබේ.

කලාපය තුල මානව ව්‍යසනයක් සිදුවෙමින් තිබෙන බවට රුසියානු ආන්ඩුව අනතුරු අඟවා ඇත. යුක්‍රේන තන්ත්‍රය විසින් ගෙන යන ගුවන් ප්‍රහාර හා කාලතුවක්කු ප්‍රහාර වලින් බේරීම සඳහා ගෙවී ගිය පැය විසිහතර තුල වැඩි දෙනෙක් කාන්තාවන් හා ලමුන් වන සරනාගතයින් 8300ක් දේශසීමාව හරහා රුසියාවට ඇතුලුවූ බව මොස්කෝව වාර්තා කලේය.

මේ සතිය පටන්ගන්නා විට සිවිල් වැසියන් 8ක් මරුමුවට පත්කරමින් ලූහාන්ස්ක් ප්‍රාදේශීය පරිපාලන ගොඩනැගිල්ලට දැමූ ජාත්‍යන්තර සම්මුතීන් මගින් තහනම් කර තිබෙන පොකුරු බෝම්බ වැනි අවි, තන්ත්‍රය විසින් පුලුල් වශයෙන් යොදාගනිමින් තිබේ.

ඩොනෙට්ස්ක් කලාපයේ වයඹ දිග ස්ලව්යාන්ස්ක්හි ක්‍රස්නී ලයිමාන් නගරයට දරුනු ලෙස ෂෙල් වෙඩි දැමීමෙන් පසුව, දක්ෂින නිකායට හා ස්වබෝධා පක්ෂයට සම්බන්ධ නව ෆැසිස්ට්වාදී කන්ඩායම් වලින් සැදුම්ලත් නැෂනල් ගාඩ් සාමාජිකයින් ප්‍රාදේශීය රෝහල වටලා එහි සිට තුවාලකරුවන් 25 දෙනෙක් ඝාතනය කල බවට වාර්තා පල විය.

ප්‍රාදේශීය ජනතාව මැඩීමට අවශ්‍ය කුමන හෝ ප්‍රචන්ඩ ක්‍රියාවක් සඳහා කොල එලිය දල්වමින් එජ හා එහි බටහිර යුරෝපීය සහචරයෝ කලාපය තුල මානවවාදී අර්බුදයක් නැතැයි ප්‍රකාශ කරති.

මේ අතර කියෙව් තන්ත්‍රය, තව තවත් ප්‍රචන්ඩ මර්දනයක් සඳහා මග පාදාගැනීම පිනිස ඩොනෙට්ස්ක් හා ලූහාන්ස්ක් යන කැරලිකාර ප්‍රදේශවල යුද නීතිය ප්‍රකාශ කිරීමේ සිය අභිප්‍රාය නිවේදනය කර ඇත.

නැගෙනහිර ගෙන යන කියෙව් තන්ත්‍රයේ ප්‍රචන්ඩ මර්දනය

පිලිබඳව හෝ සිය කැත කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා එය ෆැසිස්ට් මිලිෂියාවන් යොදාගැනීම ගැන කිසිවක් නොකියන අතර ප්‍රකාශනය, කලාපයේ ආත්මාරක්ෂක හට පිරිස් "සිය අවි බිම තැබිය යුතු බවට" බලකිරීමේ වගකීම මොස්කෝව වෙත පවරයි.

දැනටමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අනෙකුත් ආයතන හා ආන්ඩු සමග ඇතිකරගෙන තිබෙන නය ගිවිසුම් ජී7 ප්‍රකාශනය "සාදරයෙන්" පිලිගන්නා අතර එක දිගට කඩා වැටෙන යුක්‍රේන ආර්ථිකයට වෙනත් නව අරමුදල් යෝජනා කර නැත. ඒ වෙනුවට එය, කියෙව් තන්ත්‍රය, "ආර්ථික ස්ථාවරත්වය සඳහා තීරනාත්මක වන දුෂ්කර ප්‍රතිසංස්කරන සඳහා දී ඇති පොරොන්දු ඉටුකල යුතු බවට හා පුද්ගලික අංශයේ මූලිකත්වය සඳහා ආර්ථික සීමා ඉවත්කල යුතු බව" කියා සිටියි. එම 'ප්‍රතිසංස්කරන' දැනටමත් දුගී භාවයේ ගැලී සිටින ජනතාව සඳහා පොරොන්දු වන්නේ, විරැකියාව උග්‍ර කිරීම හා දරුනු කප්පාදුය.

කෙසේ වුව ද සම්බාධක පිලිබඳ ප්‍රශ්නයේදී ප්‍රකාශනය, "සිදුවීම් හමුවේ ඉල්ලා සිටින පරිදි රුසියාව මත තවත් බර පැටවෙන සැලකිය යුතු අමතර සීමා සහිත පියවර ගැනීම හා ඉලක්ක කල සම්බාධක සඳහා සූදානම්" බව කියා සිටියි. රාජ්‍ය නායකයින් හත්දෙනා රුසියානු සමාගම් කිහිපයකට හා පුද්ගලයින්ට සීමිත සම්බාධක පැනවීමේ තීරනය සනාථ කරයි. එවන් නව පියවර ඉල්ලා සිටිනු ඇති 'සිදුවීම්' මොනවාදැයි එය සඳහන් කරන්නේ නැත.

නිදසුනක් ලෙස රුසියාවේ තෙල් හා ගෑස් කර්මාන්තය ඉලක්ක කිරීම වැනි අංශගත සම්බාධක පිලිබඳව එහි කිසිදු සඳහනක් ඇත්තේ නැත. ඔබාමා පාලනාධිකාරය එවැනි දේ සඳහා බලපෑම් කලේය.

රහසේ ගොඩබෑස සිදුකරන මෙහෙයුම් සඳහා සැලසුම්කර ඇති, යුරෝ බිලියන 1.2ක් හෙවත් ඩොලර් බිලියන 1.6ක් වටිනා අති නවීන මිස්ට්‍රල් යුද නැව් දෙකක් මොස්කෝවට අලෙවි කිරීමට ප්‍රන්ස ආන්ඩුව ගෙන ඇති තීරනය ක්‍රියාත්මක කිරීම පිලිබඳව ප්‍රන්ස ජනාධිපති ප්‍රන්සුවා ඔලන්ද් හා ඔබාමා අතර හටගත් ගැටුම තුල, වොෂින්ටනය හා එහි යුරෝපීය සහචරයින් අතර බෙදීම් නග්න ලෙස මතුව ආවේය. මේ මාසයේ අග, යුද නැව්වල ක්‍රියාකාරිත්වය පිලිබඳව රුසියානු නාවිකයින් 400ක් පුහුනු කිරීම ප්‍රන්සය විසින් ආරම්භ කිරීමට නියමිතය.

සමුලු රැස්වීමෙන් අනතුරුව ඔබාමා, බ්‍රසල්ස්හි පැවති මාධ්‍ය හමුවකදී මිස්ට්‍රල් අලෙවිය මත "නැවතීමේ බොත්තම එබීම හොඳ විය හැකි බව මම සිතමි. මේ දක්වා ජනාධිපති ඔලන්ද් වෙනස් තීරන මත එල්බ සිටියි." ඔබාමා එසේ පැවසීය.

අලෙවිය අවලංගු කිරීම පිලිබඳ මොනම අදහසක් හෝ ඔලන්ද් විසින් ප්‍රතික්ෂේප කර ඇත. "කොන්ත්‍රාත්තුවට බාධා එල්ල වුවහොත් වන්දි ගෙවීමට සිදුවනු ඇත. එවන් දෙයකට යොමුවීමට කිසිදු හේතුවක් නැත." ඔහු පැවසීය. ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල් ඔලන්ද්ගේ ආස්ථානයට සහාය දැක්වූවාය. යුරෝපීය සංගමය පුලුල් සම්බාධක කිසිවක් අනුමත කර නැති බැවින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ප්‍රන්සයට කිසිදු හේතුවක් ඇත්තේ නැතැයි ඇය තර්ක කලාය.

සුඩානය, ඉරානය හා කියුබාවට එරෙහි එජ සම්බාධක උල්ලංඝනය කර ඇතැයි යන චෝදනාව මත යෝධ ප්‍රන්ස බැංකුවක් වන බීඑන්පී පැරිබාස් බැංකුවට විරුද්ධව එජ අධිකරන දෙපාර්තමේන්තුව විසින් ගෙන යන අපරාධ පරීක්ෂනය පිලිබඳව "සාධාරන" විසඳුමක් සඳහා ඔලන්ද්ගෙන් කෙරුනු ආයාචනය ඔබාමා විසින් ප්‍රසිද්ධියේම බැහැර කිරීම මත එජ-ප්‍රන්ස සම්බන්ධතා තවදුරටත් පලුදු විය. "අසමතුලිත" හා ප්‍රන්ස ආර්ථිකය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි යයි ඔලන්ද් තර්ක කර ඇති මෙම ප්‍රශ්නයට සම්බන්ධ බැංකුවට නියම කරනු ඇති දඩය ඩොලර් බිලියන 10 ඉක්මවනු ඇති බවට වාර්තා පලවී ඇත.

වඩා ලිහිල් විසඳුමක් ඉදිරිපත් කිරීමට තමන් කිසිවක් නොකරන බව ඔබාමා පවසා ඇත. "එජ සම්ප්‍රධාය වන්නේ, ජනාධිපති අධිකරන කටයුතු වලට මැදිහත් නොවීමයි." ඔහු බ්‍රසල්ස්හි වාර්තා කරුවන්ට පැවසීය.

ජී7 අනෙකුත් සාමාජිකයින් වැඩි දෙනෙක් රුසියානු ජනාධිපති සමග ද්විපාර්ශවික සාකච්ඡා සංවිධානය කර ඇත ද ව්ලැඩිමීර් පුටින් සමග හමුවක් සඳහා ඔබාමා දැරූ උත්සාහය අසාර්ථක විය. දෙවන ලෝක සංග්‍රාමය අවධියේ ඩී-ඩේ ගොඩබැසීමෙහි 70 වන සංවත්සරය සඳහා සහභාගී වන ලෙස ඔලන්ද් පුටින්ට ආරාධනා කර තිබුනි.

ඔලන්ද් මෙසේ පවසමින් ආරාධනය යුක්තිසහගත කලේය. "රුසියානු ජනතාවට, එවක සෝවියට් ජනතාවට, අප නයගැති බව අපි දනිමු. නාසි සේනාංක හා රුසියානු ජනතාවගේ වධ වේදනා හමුවේ ආරක්ෂාවීමේදී ඔවුන් වීරෝදාර විය." ප්‍රන්ස ජනාධිපති බ්‍රහස්පතින්දා වෙන වෙනම රාත්‍රී භෝජන සංග්‍රහයන් දෙකක් සූදානම්කර තිබුනි. එකක් ඔබාමා සමග පැරිසියේ භෝජනාගාරයකය. අනෙක පුටින් සමග එල්සී මාලිගාවේය.

ජර්මන් චාන්සලර් මර්කෙල් මාධ්‍ය සමුලුවකදී මෙසේ පැවසුවාය. "මේ තර්ජන පිලිබඳ කාරනයක් නොවේ....අපට අවශ්‍ය සාකච්ඡාවකි" බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරොන් ද පුටින් සමග වෙනම රැස්වීමක් සංවිධානය කර තිබුනි. බ්‍රසල්ස්හි මාධ්‍ය සමුලුවකදී ජපාන අගමැති ෂින්සෝ අබේ මෙසේ පැවසීය. "මම ජනාධිපති පුටින් සමග දිගටම කථා කිරීමට බලාපොරොත්තු වෙමි." පුටින් සමුලුවට සහභාගී නොවීම ගැන ඔහු කනගාටුව පල කරන බවක් ද පෙනී ගියේය.

ධවල මන්දිරයේ සහකාර ආරක්ෂක උපදේශක බෙන් රෝඩ්ස්, මෙම ද්විපාර්ශවික රැස්වීම් ගැන වොෂින්ටනයේ විරුද්ධත්වය ප්‍රකාශ කලේය. "යුක්‍රේනයේ අනාගතය පිලිබඳව කියෙව් ආන්ඩුවේ නායකයා සමග විවිධ රටවල් සාකච්ඡා පැවැත්වීම නොකල යුතු බව අපි නිතරම කියා ඇත්තෙමු." ඔහු වාර්තාකරුවන්ට පැවසීය.

බටහිර රටවල සැලකිය යුතු ධනයක් ආයෝජනය කර ඇති ප්‍රකෝටිපති කතිපයාධිකාරීන්ගේ පාලක ස්ථරයකගේ අවශ්‍යතා නියෝජනය කරන පුටින් සිය පාර්ශවයෙන්, යුක්‍රේනය පිලිබඳව සම්මුතියකට ඒමට තමන්ගේ සූදානම අඟවා ඇත. ඔහු යුක්‍රේන දේශසීමාවෙන් රුසියානු හමුදා ඉවත්කර ගැනීමට නියෝග කර ඇති අතර මැයි 25දා මැතිවරනය ද පිලිගෙන තිබේ. රුසියානු තානාපති 07දා පැවැත්වෙන පොරොෂෙන්කෝගේ ආරම්භක උත්සවයට සහභාගී වන බව 05දා නිවේදනය කලේය.

04දා රාත්‍රියේ විකාශනය කල ප්‍රන්ස රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී පුටින්, වොෂින්ටනය හා බටහිර යුරෝපය අතර බෙදීම් ගසාකෑමට උත්සාහ කරමින් තමන් "කතාබහට සූදානම්" බව කියා සිටි අතර "වඩාත්ම ආක්‍රමනශීලී හා දරුනු ප්‍රතිපත්තිය ගෙන යන්නේ එජ බව නොරහසකි." යනුවෙන් ද පැවසීය.

© www.wsws.org